ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date. 2026.02.16

එම්.ඒ. සිරියලතා
123/14, කිතුලවිල,
කිරිවත්තුඩුව.
-පැමිණිලි පාර්ශවය-

බී.ජී. හර්ෂ විරාජ්
577/15, නුවරඑළිය පාර,
පුස්සැල්ලාව.
-අගතියටපත් පාර්ශවය-

පැමිණිලි අංක HRC/1886/20
HRC/2215/20

යුධ හමුදාපති
යුධ හමුදා මූලස්ථානය,
බත්තරමුල්ල.
-වගඋත්තරකාර පාර්ශවය-

<u>පැමිණිල්ලෙන් ඉදිරිපත් කරන කරුණු හා ඉල්ලා සිටින සහනයන්,</u>

මෙහි පැමිණිලිකාරිය විසින් අගතියටපත් පාර්ශවය ලෙස සඳහන් යුධ හමුදාවේ සේවය කරන බී.ජී. හර්ෂ විරාජ් යන තම පුත්‍රයාට රාජකාරි කිරීමේදී සිදුවූ අසාධාරණය සම්බන්ධයෙන් සාධාරණයක් කරන ලෙසට හා සැරයන් නිලයේ සිට කෝප්‍රල් නිලය දක්වා පහත හෙලන ලද නිලය නැවත ලබා දෙන ලෙස ඉල්ලා මෙම පැමිණිල්ල ඉදිරිපත් කර සිටි.



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක. 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு - 04. / No. 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairman: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

අගතියටපත් පාර්ශවයේ ප්‍රකාශය.

- සෙ/677770 කෝප්‍රල් විරාජ් බිජීඑන් වන තමා ශ්‍රී ලංකා යුධ හමුදාවේ පොලිස් හේවා බලකාය යටතේ රාජකාරි කරනු ලබන කොමිෂන් නොලත් නිලධරයෙකු වන බව.
- තමා 2020-02-06 වන දින සැරයන්වරයකු වශයෙන් යුධ හමුදා රෝහල - කොළඹ වෙත විනය ආරක්ෂක අංශභාර ජ්‍යෙෂ්ඨ කොමිෂන් නොලත් නිලධාරි වශයෙන් රාජකාරි කිරීම සඳහා වාර්තා කළ අතර, තමා එදින සිට 2020-02-17 දින දක්වා රාජකාරි කළ අතර, එම කාල සීමාව තුළදී සිදුවූ සිද්ධින් දෙකක් නිසාවෙන් තමාට අසාධාරණයක් සිදුවූ බව.
- 2020-02-07 දින ලාන්ස් කෝප්‍රල් මධුසංක එම්එච් සමගින් යුධ හමුදා රෝහලේ ප්‍රධාන දොරටුවේ රාජකාරි කරමින් සිටියදී රාජකාරිය නිම වී රෝහලෙන් පිටතට යාමට පැමිණි අයවලුන් පරික්ෂා කිරීමේදී සෙබලුන් කිපදෙනෙකු තම රැවුල කපා නොසිටි බව නිරීක්ෂණය වූ අතර, පසුව ඔවුන්හට අවවාද කර ඔවුන් පිටත්කර යැවූ අතර, එම ස්ථානයට පැමිණි කෝප්‍රල් කුමාර එන්එච්සිඑස් යන අයද පෙරකී අය මෙන් පැමිණි අතර, තමා සමග රාජකාරි කළ ලාන්ස් කෝප්‍රල් මධුසංක යන අය කෝප්‍රල් කුමාර යන අයව නිරීක්ෂණය කර තමා වෙත ඉදිරිපත් කළ අතර, ඔහුව බාහිරින් පරික්ෂා කිරීමේදී ඔහු ඇඳ සිටි ඩෙනිම් කලිසමේ ගොල්ෆිය පෙදෙස අස්වාභාවික ලෙස ඉදිරියට නෙරා ඇති බව තමාට නිරීක්ෂණය වූ බව.
- මීට ප්‍රථමද මෙම රෝහලේ ඖෂධ සොරෙන් රැගෙන යද්දී අප අංශය මගින් අත්අඩංගුවට ගෙන ඇති බැවින් තමා තුළද ඇති වූ සැකය නිසාවෙන් අදාළ අය පරික්ෂා කරන මෙන් තමා විසින් ලාන්ස් කෝප්‍රල් මධුසංක වෙත උපදෙස් ලබා දුන් බවත්, ඒ අනුව කෝප්‍රල් කුමාර යන අයව අප විවේක ගන්නා ස්ථානයට රැගෙන ගොස් ලාන්ස් කෝප්‍රල් මදුසංක විසින් පරික්ෂා කරන ලද නමුත් කිසිවක් හමු නොවූ බැවින් ඔහුහට අවවාද කර මුදාහරින ලද බව.
- පසුව කෝප්‍රල් කුමාර විසින් එම පරික්ෂා කිරීම වැරදි බව පවසමින් ජ්‍යෙෂ්ඨ නිලධාරින්ට දන්වා ඇති අතර, තමා විසින්ද ජ්‍යෙෂ්ඨ නිලධාරින් වෙත එම පරික්ෂා කිරීම පිළිබඳව කරුණු දක්වා සිටි බව.
- 2020-02-17 දින යුධ හමුදා රෝහලේ රාජකාරි සඳහා කෝප්‍රල් බණ්ඩාර ඩීට්වයි පැමිණි අතර, තමා ඔහු සමගින් යුධ හමුදා රෝහලේ ප්‍රධාන දොරටුවේ රාජකාරි කරමින් සිටියදී 07.00 පැයට පමණ එම ස්ථානයට පැමිණි මීට ප්‍රථම දැක නොමැති ගජබා රෙජිමේන්තුවට අයත් ලාන්ස් කෝප්‍රල් රනිල් ඩීජ් යන අය කෝප්‍රල් බණ්ඩාර හමුවී කිසිවක් පවසා පසුව කෝප්‍රල් බණ්ඩාර විසින් ඔහුව තමා වෙතට යොමු කරන ලද බවත්,පසුව ඔහු තමා වෙත පැමිණි පසු තමා විසින් අවශ්‍යතාවය කුමක්දැයි විමසූ අවස්ථාවේ "මට කඩේට යන්න ඕනා"යනුවෙන් පවසන ලද බවත්, එම අවස්ථාවේදී තමා විසින් ඔහු ඇඳ සිටි නිළ ඇඳුම පරික්ෂා කිරීමේදී ඔහු පූර්ණභූමි යන උතුරු නැගෙනහිර පදක්කම් දෙක සහිත පීත්ත පටිය පැළඳ සිටිනු දැක තමා විසින් ඔහුගෙන් සේවා කාලය කියද ? මෙම පදක්කම් ඔබට හිමිගන්වා ඇත්ද? යන්න ඇසූ විට ඔහු විසින් "මගේ සේවා කාලය අවුරුදු 07යි,හිමිගන්වා

නැහැ "යැයි පවසන ලද බවත්, යුධ හමුදා පනතට අනුව තමාට හිමි ගන්වා නොමැති පදක්කම් හා පළඳනා පැළඳ සිටීම වරදක් බැවින් තමා විසින් කෝප්‍රල් බණ්ඩාරට මොහු හට සෙබල විනය යටතේ සිදුවීම් රපෝර්තුවක් ඉදිරිපත් කරන ලෙස දන්වා සිටියදී මොහු විසින්"මම බ්‍රිගේඩියර් කාරියවසම්ගේ බඩියා " යනුවෙන් පවසන ලද බවත්, පසුව තමා විසින් ඔහුහට රපෝර්තුවක් ඉදිරිපත් නොකර ඔහුගේ අවශ්‍යතාවය සපුරා ගැනිමට අවස්ථාව ලබා දුන් බව.

- පසුව එදිනම යුධ හමුදා රෝහලේ සෑම සතියේ සඳුදා දිනකම කළමනාකරණ හා නඩත්තු අධ්‍යක්ෂක මණ්ඩලයේ අධ්‍යක්ෂකතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වන සාකච්ඡාව සඳහා තමා සහභාගි වි සිටියදී යුධ හමුදා රෝහලේ කළමනාකරණ හා නඩත්තු අධ්‍යක්ෂක මණ්ඩලයේ අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් කාරියවසම් විසින් තමා හට "තමුන් නේද මේ දවස්ටිකේ හිටපු සාජන් මගේ කාර්යාලයට ඇවිත් මාව හමුවෙනවා".යනුවෙන් පවසන ලද බව.
- පසුව සාකච්ඡාව අවසානයේ බ්‍රිගේඩියර් කාරියවසම් නිලධාරියාගේ කාර්යාලයට ගිය අවස්ථාවේ එම නිලධාරියා විසින් තමාට බැනවදිමින් තමාට විරුද්ධව සාක්ෂි සාදා තමන්ව යුධ හමුදාවෙන් ඉවත් කරන බවත්,තමන් ගැහැණු ළමුන්ට අයුතු යෝජනා කරන බවත් අසනීප නිවාඩු යන අය හරවා යවන බවත්, ආදී ලෙස බැණ වැදුණු බවත්,පසුව තමන් එම ස්ථානයෙන් ඉවත්ව නැවත තමා රාජකාරි කරනු ලබන ස්ථානයට පැමිණ තම අණ දෙන නිලධාරි නී/66958 මේජර් ඩබ්ඩීඑන්සි කුලතිලක වෙත මේ සම්බන්ධව පැවසු බව.
- මෙම සියලු කරුණු තමා දෛනික සිදුවීම් පොතෙහි සටහන් කරන ලද බවත්, පසුව මෙම සිදුවිමෙන් පසුව තමා එම ස්ථානයෙන් රාජකාරියෙන් මිදි තමා මුදා හැරිම සඳහා පැමිණි මාණ්ඩලික සැරයන් ධර්මරත්න කේඑම්. හට තමා භාරයේ තිබූ රාජකාරි දෛනික සිදුවීම් පොතේ සටහන් තබමින් නිවැරදිව භාර දී සවස 06.00ට තමා සේවයෙන් ඉවත් වු බවත්, පසු දින උදෑසන තමාට මාණ්ඩලික සැරයන් ධර්මරත්නට දුරකතනයෙන් ඇමතුමක් ගෙන දෛනික සිදුවීම් පොත එදින පැය 22.00 පසු අස්ථාන ගතවී ඇති බව දන්වා සිටින ලද බව.
- මෙම අස්ථාන ගත වු දෛනික සිදුවීම් පොත පිළිබඳව ඉහළ නිලධාරින් දැනුවත් කළත් ඒ සම්බන්ධයෙන් පියවර නොගත් අතර, එම දෛනික සිදුවීම් පොත අස්ථානගත විමෙන් තමාට තිබූ සියලු සාක්ෂි ඒ සමග අස්ථාන ගත වි ඇති බව.
- සාමාන්‍ය සෙබල චන්ද්‍රසිරි යන අයට තමාට විරුද්ධව ප්‍රකාශයක් ලබාදිමට බලපෑමක් සිදුකරන බවට තමාට ලැබුණු ආරංචියක් අනුව ඔහු හට දුරකථන ඇමතුමක් ලබාදි එය සත්‍ය සිදුවිමක් දැයි විමසු විට ඔහු එය සත්‍යයක් බව පවසන ලද අතර, ඒ බව සනාථ කිරිමට අදාළ දුරකථන සංවාදයේ පටිගත කිරිම ඉදිරිපත් කර සිටින බව.
- මෙලෙස නිලධාරීන්ට බලපෑම් සිදුකරමින් ප්‍රකාශ ලබා ගැනිමෙන් පසු තමාට එරෙහිව චෝදනාපත් ගොනු කර ඇති බව.
- චෝදනා පත්‍රයක් විභාග කිරිමට පැය 24කට පෙර අදාළ චෝදනා පත්‍රය චූදිතයාට ලබා දිය යුතු වුවත්, 2020-08-20 දින පැය 20.00 රාජකාරියට වාර්තා කළ තමාහට 2020-08-21 පවත්වන ලද

චෝදනාපත්‍ර විභාගය සඳහා 2020-08-21 උදෑසන අදාළ චෝදනා පත්‍රය ලබා දීමෙන් තම මානව හිමිකම් උල්ලංඝනය කර ඇති බව.

- චෝදනාපත්‍රය විභාග කිරිමේදි පළමු චෝදනාව එනම් තමා විසින් කාන්තා සෙබලියන් හට සිදුකර ඇතැයි පවසන කරුණු ප්‍රකාශ ලබාදීමේදි පිළි නොගත් අතර විභාග කිරිමේදි ද තමා විසින් එම චෝදනා පිළි නොගන්නා ලද බව.
- පසුව මධ්‍යස්ථාන සේනාවිධායකතුමන් විසින් එය යුහ/නීති/301/නි/පොදු හා 2010-12-24 දිනැති යුහ නියෝගයට පරිභාහිරව අදාළ බ්‍රිගේඩියර් කාරියවසම් යන ජොෂ්ඨ නිලධාරියාගේ බලපෑමට යටත්ව තමා නිවැරදිකරු යැයි පවසා සිටියදි ඒකපාක්ෂික සාක්ෂි පදනම් කර ගනිමින් තමාව වැරදිකරු කර තමාගේ එක් නිලයක් පහත හෙලන ලද බව.
- වගඋත්තරකාර පාර්ශවය විසින් එම යුධ හමුදා නියෝගයට අනුව ක්‍රියා කර සිටියේ නම් තමා නිවැරදි කරු යැයි ඔප්පු කිරිමට අවස්ථාව ඇතත් එවැනි අවස්ථාවක් තමා හට ලබා නොදෙන ලද බව.
- පසුව තමාගේ විභාග කරන ලද චෝදනාපත්‍රය නීති සේවා අධ්‍යාක්ෂක මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ අවස්ථාවේදි එය යුහ/නීති/301/නි/පොදු හා 2010-12-24 දිනැති යුධ හමුදා නියෝගයට පරිභාහිරව විභාග කර ඇති බැවින් නිවැරදිකරු යැයි පවසා සිටියදී යුධ/නිති/301/නි/පොදු හා 2010-12-24 දිනැති යුධ හමුදා නියෝගයට අනුව සිදු කළ යුතු සාක්ෂි සම්පින්ඩනය සිදුකර නැවත අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලෙස අනුමැතියෙන් තොරව නැවත රෙජිමේන්තු මධ්‍යස්ථාන ශ්‍රී ලංකා පොලිස් හේවා බලකාය වෙත නීතිසේවා අධ්‍යාක්ෂ මණ්ඩලය වෙතින් ඉදිරිපත් කරන ලද බව.
- යුධ හමුදා නියෝගයට අනුව සාක්ෂි සම්පින්ඩනය චෝදනා පත්‍රය විභාග කරන අවස්ථාවේදීම සිදු කළ යුතු අතර, චෝදනා පත්‍ර විභාග කළ අවස්ථාවේදි චූදිතයාට ලබා දිය යුතු හා කාර්යාලීය පිටපතෙහි චූදිතයා පිටපත් ලබාගත් බවට අත්සන් කළ යුතු වුවත්, චෝදනා පත්‍රයේ පිටපතක් මේ දක්වා ලබා දි නොමැති බව.
- පසුව තමා වැරදිකරු කර තමාට දඩුවම් ලබා දි මාස 02කට පසු එනම් 2020-10-19 දින නැවත රෙම ශ්‍රිලයුපොහේබ වෙත කැඳවා සාක්ෂි සම්පින්ඩනය කරන ලෙස තමාහට දන්වා සිටින ලද බවත්,පසුව තමා වැරදිකරු කර තමා හට දඩුවම් ලබා දි ඇති බවත් සාක්ෂි සම්පින්ඩනය එම අවස්ථාවේදී සිදු කළ යුතු බවත්,චෝදනාපත්‍රය විභාග කර චූදිතයා වැරදිකරු කර දඩුවම් ලබාදී මාස 02කට පසු සාක්ෂි සම්පින්ඩනය සිදුකරන ලෙස උපදෙස් ලබාදී නොමැති බවත්, එම අවස්ථාවේදි තමාගේ නිලය මෙම නිලය නොවන බවත් තමා ඒ සිදුවූ අසාධාරණය වෙනුවෙන් මානව හිමිකම් කොමිසමට පැමිණිල්ලක් ගොනු කර ඇති බැවින් ද තමා විසින් එය සිදු කිරිමට නොහැකි බව පවසමින් ලිඛිත ප්‍රකාශ ලබා දෙන ලද බව.
- පසුව එම ලිඛිත ප්‍රකාශ සමගින් නැවත තමාගේ චෝදනාපත්‍රය අනුමැතිය සඳහා නීතිසේවා අධ්‍යාක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරිමෙන් පසු යුහ/නීති/301/19 චෝදනාපත් 2020(113) හා 2020-10-

19 දිනැති නීතිසේවා අධ්‍යක්ෂ මණ්ඩල ආවරණ ලිපියේ සඳහන් නිරීක්ෂණ 08ක් සමගින් නැවත අනුමැතියෙන් තොරව රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා යුධ හමුදා හේවා බලකාය වෙත ඉදිරිපත් කරන ලද බවත්, පසුව එම චෝදනාපත්‍රය අනුමත වූ ආකාරය තමාට ගැටලු සහගත වන බව.

- මෙය බලපෑමකට යටත්ව සිදුකළ විමර්ශනයක් බවට සනාථ කිරීමට හැකි වනුයේ තමා හට විරුද්ධව එවන ලද ලිපියේ සඳහන්ව ඇත්තේ කාන්තා සෙබලියන් දෙදෙනෙකු පමණක් වුවත් පසුව එය කාන්තා සෙබලියන් තිදෙනෙකු බවට පරිවර්තනය වී ඇති අතර,අනෙක් කාන්තා සෙබලිය තමා විසින් ඇය හට සිදුකළ හා පැවසූ දේ ඇය හට අමතක වී තිබූ බවත් පසුව එය මතක් වූ බවත් ප්‍රකාශ ලබා දෙමින් පවසා ඇති අතර, බලපෑමක් කර ප්‍රකාශ ලබා ගෙන ඇති බවද මෙමගින් තහවුරු වන බව.
- තමාට එරෙහිව ඇති චෝදනා පත්‍රයට අනුව 2020-01-01 දින සිට 2020-02-17දින දක්වා කිසිදු විනයාරක්ෂිත රාජකාරියක් ඉටු නොකර කාන්තා සෙබලියන් හට අසභ්‍ය වචනයෙන් බැන වදිමින් කාන්තා සෙබල බස්නායකගේ පපු ප්‍රදේශයට පිටිඅල්ලෙන් පහර දී සිට ඇති අතර, එය වෛද්‍ය වාර්තාවක් මගින් සනාථ කර ගැනීමට හැකියාවක් තිබූ අතර සිසිටීවී පරීක්ෂා කිරීමටද හැකියාව තිබූ නමුත් එවැන්නක් සිදුකර නොමැති බව.

<u>වගඋත්තරකරුගේ ප්‍රකාශය</u>

- මෙම කොමිෂන් නොලත් නිලධාරියා යුධ හමුදා රෝහලේ ප්‍රධාන දොරටුවේ රාජකාරි කරමින් සිටියදී විනය විරෝධී ක්‍රියාවන් සිදුකරනු ලබන බවට සඳහන් කරමින් යුධ හමුදා රෝහල- කොළඹ රාජකාරි කරනු ලබන සෙබලුන් පිරිසක් අධ්‍යක්ෂ කළමනාකරණ හා නඩත්තු අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇති ලිපියෙහි අඩංගු කරුණු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා යුධ හමුදා පොලිස් හේවා බලකාය විසින් විමර්ශනයක් සිදුකර ඇති අතර, එම විමර්ශනයේදී අනාවරණය වූ පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් චෝදනා ගොනු කර ඇති බව. (පිටුව 90)

i ප්‍රධාන දොරටුවේ වෙනත් රාජකාරි වෙනුවෙන් රපෝර්තු කර ඇති කාන්තා සෙබලියන් වෙත අයුතු ලිංගික බලපෑම් සිදු කිරීම.

මෙම කරුණු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා පොලිස් හේවා බලකාය විසින් සිදු කරන ලද පරීක්ෂණයට අනුව යුධ හමුදා රෝහලේ ප්‍රධාන දොරටුවේ රාජකාරි සඳහා පැමිණෙන ලද කාන්තා සෙබලියන්හට යුධ හමුදා පොලිස් කොමිෂන් නොලත් නිලධාරියකුට උචිත නොවන අයුරින් පැමිණිලිකරු විසින් අනෙකුත් යුධ හමුදා සාමාජිකයින් හා විවිධ අවශ්‍යතාවයන් සඳහා යුධ හමුදා රෝහල වෙත පැමිණෙන පුද්ගලයින් ඉදිරිපිට අසභ්‍ය වචන භාවිතා කර ඇති බවට කරුණු අනාවරණය වී ඇත. පැමිණිලිකරු විසින් ප්‍රකාශ ලබා දෙමින් ඉහත චෝදනාව ප්‍රතික්ෂේප කර තිබුණද ඉහත කරුණු සනාථ කරමින් එම කාන්තා සෙබලියන්, එම ස්ථානයේ රාජකාරි කරන ලද සෙබලුන් තිදෙනෙකු ප්‍රකාශ ලබා දී ඇත. ඒ

අනුව ඉහත කාරණය සනාථ වීම නිසා පැමිණිලිකරු හට යුධ හමුදා පනතේ 109 (ඉ) වගන්තිය ප්‍රකාරව චෝදනා ගොනු කර ඇත.තවද ඉහත කරුණ නිදහස් සාක්ෂි මගින් අනාවරණය වී තිබියදීත් චෝදනා නොපිළිගනිමින් අසත්‍ය ප්‍රකාශ සිදුකිරීම හේතුවෙන් යුධ හමුදා පනතේ 116(ඇ) වගන්තිය යටතේද චෝදනා ගොනු කර ඇති බව.

ii ජ්‍යෙෂ්ඨ නිලධාරියකුගේ පුද්ගලික සහායක අවශ්‍යතාවයක් සඳහා ප්‍රධාන දොරටුව වෙතින් යාමට පැමිණීමේදී හිතාමතා එම ජ්‍යෙෂ්ඨ නිලධාරියාගේ නම සඳහන් කරමින් සියල්ලන් ඉදිරියේ එම ජ්‍යෙෂ්ඨ නිලධාරියාගේ හා පුද්ගලික සහායක වෙත නිකරුණේ බැන වැදීම තුළින් නිලධාරියෙකුගේ පුද්ගලිකත්වයට හා යුධ හමුදා විනයට පරිහානිරව ක්‍රියා කර ඇති බව.

මෙම කරුණ බ්‍රිගේඩියර් ඩීවීපී කාරියවසම් යන ජ්‍යෙෂ්ඨ නිලධාරියාගේ හා එම නිලධාරියාගේ පුද්ගලික සහායක වන ලාන්ස් කෝප්‍රල් රනිල් විසින් ලබාදී ඇති ප්‍රකාශ තුළින් සනාථ වී ඇත. ඒ අනුව යුධ හමුදාවේ ජ්‍යෙෂ්ඨ කොමිෂන් නොලත් නිලධාරියකුට උචිත නොවන අයුරින් කටයුතු කිරීම සබැඳිව යුධ හමුදා පනතේ 129(1) වගන්තිය යටතේ චෝදනා ගොනු කර ඇති බව.

iii රෝහලේ රාජකාරි නියුතු නිලධාරි හා බලලත් නිලධාරි මෙන්ම මොහුට වඩා ජ්‍යෙෂ්ඨ සෙබලුන් හට නිලයට උචිත නොවන අයුරින් ආමන්ත්‍රණය කිරීම.

උක්ත කරුණට අදාළව ශ්‍රී ලංකා යුධ හමුදාව පොලිස් සේවා බලකාය විසින් සිදුකරන ලද විමර්ශනයට අනුව යම් අවස්ථා වලදී පැමිණිලිකරුට වඩා ජ්‍යෙෂ්ඨ බලලත් නිලධාරීන් හා ජ්‍යෙෂ්ඨ කොමිෂන් නොලත් නිලධාරීන් සමග රාජකාරි කිරීමේදී උචිත නොවන අයුරින් ක්‍රියා කර ඇති බවට කරුණු අනාවරණය වී ඇති බව.

iv රෝහලේ පිරිමි හෙද වෘත්තියේ කොමිෂන් නොලත් නිලධාරියකු රාජකාරි නිම වී පසු දින හට නිවාස වෙත යාමේදී තම අභිමතයට පරිදි පසෙකට ගෙන ගොස් පරීක්ෂා කිරීමට බව පවසා ඔහුගේ පුද්ගලිකත්වයට හානි වන අයුරින් සියලු ඇඳුම් ඉවත් කිරීමට අණ දී ඔහුගේ පුද්ගලික ප්‍රදේශ ස්පර්ශ කිරීම තුළින් මානසිකව හා කායිකව පීඩාවට ලක් කිරීම ( මෙම චෝදනාව සනාථ කිරීම සඳහා සාක්ෂි ඉදිරිපත් වී නොමැත.)

යුධ හමුදා රෝහල කොළඹ රාජකාරියේ නියුතු කෝප්‍රල් කුමාර එන්ජ්එස් යන කොමිෂන් නොලත් නිලධාරියා රාජකාරි නිම වී විවේක ගැනීම සඳහා වේරහැර කඳවුර වෙත යාම සඳහා සිවිල් ඇඳුමින් සැරසී ප්‍රධාන දොරටුව වෙත පැමිණි අවස්ථාවේ පැමිණිලිකරු විසින් මෙම කොමිෂන් නොලත් නිලධාරියාව සෙබලුන් විවේක ගන්වා ස්ථානයේ පරීක්ෂාවට ලක් කරන ලෙස එම ස්ථානයේ රාජකාරියේ නියුතුව සිටි ලාන්ස් කෝප්‍රල් වරයකුට උපදෙස් ලබාදී ඇත. ඒ අනුව එම ලාන්ස් කෝප්‍රල්වරයා තම නිලයට වඩා ඉහළ නිලයක් දරණ කෝප්‍රල් කුමාර එන්ජ්එස් යන කොමිෂන් නොලත් නිලධාරියා පරීක්ෂාවට ලක්කර ඇත.

එහෙත් එම ස්ථානයේ කිසිදු පුද්ගලයකු නොමැතිවීම යන හේතුව මත එම චෝදනාව සනාථවී නොමැති බව.

- මෙම විනය කඩකිරීම් සම්බන්ධයෙන් පවත්වන ලද විමර්ශනයේ රපෝර්තුවට අනුව අණදෙන නිලධාරි -1ශ්‍රී ලංකා යුධ හමුදා පොලිස් භේවා බලකාය වෙතින් මධ්‍යස්ථාන සේනාවිධායක වෙත ඉදිරිපත් කර චෝදනා විභාග කිරීමේදි පළමු චෝදනාව සඳහා පැමිණිලිකරු වරද නොපිළිගැනිම හේතුවෙන් චෝදනා පත්‍රයේ නම් කර තිබූ සාක්ෂිකරුවන් කැඳවා ඔවුන් වෙතින් ලිඛිත ප්‍රකාශ ලබාගෙන පළමු චෝදනාව සඳහා සැරයන් සිට කෝප්‍රල් දක්වා නිලය පහත හෙලා පිළිවෙලින් අනෙකුත් චෝදනා සඳහා තදින් තරවටු කර එම චෝදනාපත් අනුමැතිය සඳහා නීති සේවා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත. නීති සේවා අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් සාක්ෂි සාරාංශ වාර්තාවක් සකස් කර නැවත ඉදිරිපත් කරන ලෙස දැනුම්දිමෙන් පසුව සාක්ෂි සාරාංශ වාර්තාවක් සකස් කිරිමට කටයුතු කර ඇත. එහෙත් පැමිණිලිකරු ලඝු නඩු විභාගයට පෙනී සිටිමට, ඒ සඳහා ප්‍රකාශ ලබා දිමට, සාක්ෂිකරුවන්ගෙන් හරස් ප්‍රශ්න ඇසිමට හෝ සාක්ෂි සටහන් කර ගන්නා අවස්ථාවේ විනය ශාලාව තුළ රැදී සිටිමට අකමැත්ත ප්‍රකාශ කර ඇති බව.
- පැමිණිලිකරු 2020-02-08 වන දින අදාළ රාජකාරි ස්ථානයෙන් මුදවාලීම සඳහා පැමිණි මාණ්ඩලික සැරයන් ධර්මරත්න කේඑම් යන ජ්‍යෙෂ්ඨ කොමිෂන් නොලත් නිලධාරීහට දෛනික සිදුවීම් පොතෙහි සටහන් තබා අදාළ රාජකාරිය භාරදී 1 ශ්‍රී ලංකා යුධ හමුදා පොලිස් භේවා බලකාය වෙත පැමිණ ඇති බවත්, පසුදින එම ජ්‍යෙෂ්ඨ කොමිෂන් නොලත් නිලධාරී පැමිණිලිකරු වෙත දුරකථන ඇමතුමක් ලබා දි එම රාජකාරි ස්ථානයේ දෛනික සිදුවීම සටහන් තැබිම පොත පෙර දින 22.00 පැයෙන් පසු අස්ථාන ගතවී ඇති බව දැනුම් දි ඇති බවට පැමිණිල්ලේ ප්‍රකාශ කර ඇත. මේ පිළිබඳව නිලධාරි අණදෙන හා කණ්ඩායම් භාර බලලත් නිලධාරි දැනුවත් කර ඇති අතර, නිලධාරි අණදෙන විසින් ඒ පිළිබඳව සොයා බලන ලෙස මාණ්ඩලික සැරයන් ධර්මරත්න කේ.එම්. හට උපදෙස් ලබා දී ඇත.තවද එම දෛනික සිදුවීම් පොත හා උක්ත සිදුවීමට අදාළව සිදුකර ඇති ශ්‍රී ලංකා යුධ හමුදා පොලිස් භේවා බලකා පරික්ෂණය අතර කිසිදු සබදතාවක් නොමැති බව ශ්‍රී ලංකා පොලිස් භේවා බලකාය විසින් සඳහන් කර ඇති බව.
- පැමිණිලිකරු විසින් ඉදිරිපත් කර ඇති ලිපියෙහි 1 ශ්‍රී ලංකා යුධ හමුදා පොලිස් භේවා බලකා විශේෂ විමර්ශන ශාඛාවේ රාජකාරි කරනු ලබන ලාන්ස් කෝප්‍රල් දුල්ෂාන් එස්වී හා විනය ශාලාවේ රාජකාරි කරනු ලබන සැරයන් චතුරංග එම්යුආර්ඩී යන අය සමග සිදුකරන ලද දුරකථන සංවාද ඇති බව සඳහන් කර ඇතත්, මේ පිළිබදව ඉහත සඳහන් කරන ලද සෙබලුන්ගෙන් කරුණු විමසිමේදී විමර්ශනයට අදාළ කිසිදු තොරතුරක් ලබා නොදුන් බවට ප්‍රකාශ කර ඇත. එමෙන්ම මෙම විමර්ශනය බ්‍රිගේඩියර් ඩී.වී.පි. කාරියවසම් යන ජ්‍යෙෂ්ඨ නිලධාරියාගේ බලපෑමක් මත සිදු වුවක් බවත්, එහිදි විශේෂ විමර්ශන ශාඛාව මහත් අසරණ වූ බව පැමිණිලිකරු වෙත කෝප්‍රල් දුල්ෂාන් එස්වි දුරකථන ඇමතුමක් මගින් ප්‍රකාශ කර ඇති බව පැමිණිල්ලේ සඳහන් කර ඇතත්, මේ පිළිබඳව

කිසිදු ප්‍රකාශයක් සිදුනොකළ බවට කෝප්‍රල් දුල්ෂාන් හා සැරයන් චතුරංග විසින් ලිඛිත ප්‍රකාශ ලබා දි ඇති බව.

- මෙම සිදුවීම් වලට අදාළව පළමුව ප්‍රකාශ ලබාදීමේදී තමා විසින් කිසිදු වරදක් සිදුකර නොමැති බවට ප්‍රකාශ ලබා දුන් අයවලුන් වෙතින් පසුව බලහත්කාරයෙන් පැමිණිලිකරු වැරදි සිදුකළ බවට සඳහන් කර ප්‍රකාශ ලබා ගැනිමට කටයුතු කළ බවට සඳහන් කර 1 ශ්‍රී ලංකා යුධ හමුදා පොලිස් සේවා බලකායේ විශේෂ විමර්ශන ශාඛාවේ රාජකාරි කරන ලාන්ස් කෝප්‍රල් රූපරත්න එස්.එම් යන කොමිෂන් නොලත් නිලධාරියා විසින් පැමිණිලිකරු වෙත ඇමතුමක් ලබා දි පවසා සිටි බවට පැමිණිල්ලේ සඳහන් කර ඇතත්, ඒ පිළිබඳව ලාන්ස් කෝප්‍රල් රූපරත්න යන සෙබලාගෙන් කරුණු විමසිමේදි එවැනි ප්‍රකාශයක් ඔහු විසින් සිදු නොකළ බවට ප්‍රකාශ කර ඇත. තවද මෙම සෙබලා මේ වන විට වසර 22ක සේවා කාලයකින් පසු විශ්‍රාම ගොස් ඇති බැවින් ඔහුගෙන් ලිඛිත ප්‍රකාශ ලබා ගැනිමට නොහැකි වී ඇති බව.
- මෙම සිදුවිමට අදාළව විමර්ශන රපෝර්තුව අනුමත නොකර දින 45ක් පමණ තබාගෙන සිටි බව පැමිණිලිකරු විසින් ප්‍රකාශ කළද විමර්ශනයේදී ලබාගනු ලැබූ ප්‍රකාශයන්ට අනුව තවදුරටත් කරුණු අනාවරණය කිරිම සඳහා ප්‍රකාශයක් ලබාගත යුතුව තිබූ බැවින් අදාළ ප්‍රකාශයන් ලබාගැනිම සඳහා කාල සීමාවක් ගතවිම හේතුවෙන් යම් ප්‍රමාදයක් ඇති වී ඇති බවත් අනවශ්‍ය කාලසීමාවක් විමර්ශන රපෝර්තු අනුමත නොකර තබා ගැනිමක් සිදුකර නොමැති බවත් දන්වා සිටින බව.

<u>නිරික්ෂණ හා නිගමන</u>

- මෙම පැමිණිල්ලේ අගතියට පත් පාර්ශවය වන බි.ජී.හර්ෂ විරාජ් යන අය සැරයන්වරයකු වශයෙන් යුධ හමුදා රෝහල කොළඹ විනයාරක්ෂක අංශභාර ජ්‍යෙෂ්ඨ කොමිෂන් නොලත් නිලධාරි ලෙස සේවයට වාර්තා කර ප්‍රධාන දොරටුවේ රාජකාරි කරමින් සිටියදී සිදුවූ සිද්ධීන් කිහිපයක් හේතුකොට ගෙන වගඋත්තරකාර පාර්ශවය විසින් පැවැත්වූ ලඝු නඩු විභාගයේදී සිදුවූ අගතීන් සම්බන්ධයෙන් සහනයක් ලබා දෙන ලෙස ඉල්ලා මෙම පැමිණිල්ල ඉදිරිපත් කර ඇති බවට නිරික්ෂණය විම.

- බි.ජී. හර්ෂ විරාජ් යන අය යුධ හමුදා රෝහලේ ප්‍රධාන දොරටුවේ රාජකාරි කරමින් සිටියදී 2020-02-17 දින බ්‍රිගේඩියර් කාරියවසම් යන නිලධාරියාගේ බඩියා ලෙස හඳුන්වන ලාන්ස් කෝප්‍රල් රනිල් ඩීජ් යන අයව පරික්ෂා කිරිමේදි ඇතිවූ අමනාපයක් හේතුකොට ගෙන බ්‍රිගේඩියර් ඩී.වී.පී. කාරියවසම් යන නිලධාරියා තමාට බැණ වැදුන බවත්,තමාට විරුද්ධව සාක්ෂි සාදා යුධ හමුදාවෙන් ඉවත් කරන බවට පැවසූ බවත්, මෙම සියලු සිදුවීම් පිළිබඳව දෛනික සිදුවීම් පොතෙහි තමා විසින් සටහන් කරන ලද බවත්, එම පොත මාණ්ඩලික සැරයන් ධර්මරත්න කේ.එම්. යන අයට භාරදුන් බවත් නමුත් එදිනම එම පොත අස්ථාන ගතවී ඇති බවත්, ඒ පිළිබඳව ඉහළ නිලධාරින් දැනුවක් කළත් මෙතෙක් පියවර නොගත් බව දන්වා සිටින අතර,අගතියටපත් පාර්ශවය එහිදි තමාට තිබූ සාක්ෂි වගඋත්තරකරු විසින් අස්ථාන ගත කර ඇති බවට චෝදනා කරන අතර වගඋත්තරකරු

එම චෝදනාවේදී අගතියටපත් පාර්ශවයට එරෙහිව පවත්වන පරික්ෂණයට එහි කිසිදු සම්බන්ධතාවයක් නොමැති බවට කරුණු දක්වා සිටින බව නිරික්ෂණය වීම.

- කෙසේ නමුත් බ්‍රිගේඩියර් ඩී.වී.පී. කාරියවසම් යන අය විසින් අගතියට පත් පාර්ශවය වන හර්ෂ විරාජ් යන අයට කරන ලද බැන තර්ජනය කිරිම පිළිබඳ යුධ හමුදාව වෙත විධිමත් පැමිණිල්ලක් ඉදිරිපත් කර නොමැති බව නිරික්ෂණය වීම.

- යුධ හමුදා පොලිස් හේවා බලකා විශේෂ විමර්ශන ශාඛාවේ රාජකාරි කරනු ලබන ලාන්ස් කොප්‍රල් දුල්ෂාන් එස්.වී. හා විනය ශාලාවේ රාජකාරි කරනු ලබන සැරයන් චතුරංග එම්.යූ.ආර්.ඩී. යන අය විසින් හර්ෂ විරාජ් යන මෙහි අගතියට පත් පාර්ශවයට එරෙහිව යුධ හමුදාව විසින් පවත්වන පරික්ෂණයේ තොරතුරු ලබා දෙමින් එය බලපෑම් මත සිදුකරන බවට තමාට දුරකථනයෙන් දැනුම් දුන් බවත්,ඒ බව සනාථ කිරිමට හඬ පටිගත කර ඇති වීපය සාක්ෂියක් ලෙස (පිටුව 92) අගතියට පත් පාර්ශවය ඉදිරිපත්කර ඇති අතර, වගඋත්තරකාර පාර්ශවය විසින් ලාන්ස් කෝප්‍රල් දුල්ෂාන් හා සැරයන් චතුරංග විසින් ලබාදී ඇති ලිඛිත ප්‍රකාශ 2ක් ඉදිරිපත් කරමින් (පිටු අංක 83,84) එම නිලධාරින් අදාල විමර්ශන තොරතුරු හර්ෂ විරාජ් යන අයට ජංගම දුරකථනය මගින් ලබා නොදුන් බවට කරුණු දක්වා සිටින අතර, මෙම කාරණයේ සත්‍ය අසත්‍යතාවය සොයා බැලිමට අදාළ හඬ පටයේ සත්‍යතාවය තහවුරු කර ගැනිමට තාක්ෂණික හැකියාවක් කොමිෂන් සභාවට නොමැති බව නිරික්ෂණය වන අතර, මෙම සිදුවීම පිළිබඳව විධිමත් පැමිණිල්ලක් යුධ හමුදාව වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත් අගතියට පත් පාර්ශවය එවැන්නක් සිදුකර නොමැති බව නිරික්ෂණය වීම.

- මෙහි අගතියටපත් පාර්ශවය වන හර්ෂ විරාජ් යන අය යුධ හමුදා ප්‍රධාන දොරටුවේ රාජකාරි කරමින් සිටියදි විනය විරෝධී ක්‍රියාවක් සිදු කරනු ලබන බවට සඳහන් කරමින් යුධ හමුදා රෝහල-කොළඹ රාජකාරි කරනු ලබන සෙබලුන් පිරිසක් අධ්‍යක්ෂ - කළමනාකරණ හා නඩත්තු අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇති ලිපියෙහි අඩංගු කරුණු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා යුධ හමුදා පොලිස් හේවා බලකාය විසින් විමර්ශනයක් සිදුකර එම විමර්ශනයේදී අනාවරණය වූ කරුණු සම්බන්ධයෙන් හර්ෂ විරාජ් යන අයට චෝදනා 03ක් සම්බන්ධයෙන් චෝදනා පත්‍රයක් ගොනු කර 2020-08-21 දින ලඝු නඩු විභාගයක් පවත්වා ඇති බව නිරික්ෂණය වීම.

- චෝදනාපත්‍රයට අනුව (පිටුව86) 2020-08-21 දින පැවැත්වූ විභාගයේදි පළමු චෝදනාව "අපකීර්තිකර හැසිරීම" ලෙසත් දෙවන චෝදනාව "කාර්යාලීය ලේඛන වරදවා පෙන්වීම හා අසත්‍ය ප්‍රකාශ" ලෙස දක්වා ඇති අතර, තුන්වන චෝදනාව ලෙස "සංග්‍රාමික විනයට හානිකර හැසිරීම" ලෙස දක්වා ඇති අතර, දුන් දඬුවම ලෙස චූදිත නිලධාරියා පළමු චෝදනාව පිළිනොගන්නා බවත්

නමුත් සාක්ෂි අනුව වැරදිකරු කර සැරයන් සිට කෝප්‍රල් දක්වා නිලය පහත හෙලන බවත්, දෙවන හා තුන්වන චෝදනාවන් පිළිගන්නා බවත්, දෙවන චෝදනාවට තදින් තරවටු කර තුන්වන චෝදනාව සඳහාද තදින් තරවටු කරන බව දක්වා ඇති බව නිරීක්ෂණය වුවත්, මෙලෙස 2020-08-21 දින පැවැත්වූ ලඝු නඩු විභාගයේ චෝදනාපත්‍ර අනුමැතිය සඳහා නීති සේවා අධ්‍යක්ෂක මණ්ඩලය වෙත ඉදිරිපත් කළ අවස්ථාවේ අදාළ චෝදනාපත්‍රය සාක්ෂි සාරාංශ වාර්තාවක් සකස් කර ඉදිරිපත් කර නොමැතිවීම නිසා ඊට අනුමැතිය ලබාදී නොමැති අතර, ඒ අනුව සාක්ෂි සාරාංශ වාර්තාවක් සකස් කර නැවත ඉදිරිපත් කරන ලෙස නිති සේවා අධ්‍යක්ෂ මණ්ඩලය දැනුම්දී ඇති බව වගඋත්තරකාර පාර්ශවය පිළිගෙන ඇති අතර, (88 පිටුව) ඒ අනුව 2020-08-21 පැවැත්වූ ලඝු නඩු විභාගය 2010 පෙබරවාරි 08 දිනැතිව හා 2010 දෙසැම්බර් 24 දින නිකුත්කර ඇති අංක යුහ/නීති/301/නි/පොදු( ) යටතේ නීති සේවා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලඝු නඩු විසදිමේදි ලබාදි ඇති උපදෙස් මාලාවට ( පිටු 55,49) පටහැනිව කටයුතු කිරිමක් බව නිරීක්ෂණය වීම.

- 2010 පෙබරවාරි මස 08 දිනැති යුහ/නී/301/නි/පොදු ( ) උපදෙස් මාලාව (පිටුව55) ආරම්භයේදි යුධ හමුදා සාමාජිකයින් විසින් සිදුකරනු ලබන විනය කඩකිරිම් සම්බන්ධයෙන් එම හමුදා සාමාජිකයින්ට එරෙහිව ලඝු නඩු විභාග කිරීමේදි 1949 අංක 17 දරණ යුධ හමුදා පනත, එම පනත යටතේ පනවා ඇති රෙගුලාසි හා ලඝු නඩු විසදිමට අදාළ වෙනත් හමුදා නියෝග මගින් දක්වා ඇති ලඝු නඩු විසදිමේ ක්‍රියා පිළිවෙත නිසි පරිදි අනුගමනය කිරීම නෛතික අවශ්‍යතාවයක් බවත් යුධ හමුදාවේ පවත්වන ලඝු නඩු විභාග කිරීම් වලින් පසු ලබා දි ඇති වරදකරු කිරීම් සහ දඩුවම් වලට එරෙහිව යුධ හමුදා පනතේ 79 වගන්තිය යටතේ අභියාචනාධිකරණයේ රිට් පෙත්සම් ගොනු කළහැකි බවත්,මෑත අතීතයේදි එලෙස ගොනු කරන ලද සමහර රිට් පෙත්සම් සඳහා අභියාචනාධිකරණය මගින් ලබාදි ඇති තීන්දු වලට අනුව එම ලඝු නඩු විසදීමේ ක්‍රියා පිළිවෙත නිසි පරිදි ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය මෙන්ම අදාළ ලඝු නඩු විභාගයන් ස්වාභාවික යුක්ති මුලධර්මයන්ට අනුකූලව සාධාරණව හා යුක්ති සහගතව පැවැත්විමේ අවශ්‍යතාවය එම අධිකරණය මගින් දැඩි ලෙස අවධාරණය කරනු ලැබ ඇති බවත්, දක්වා ඇති බව නිරීක්ෂණය වන අතර, මෙම උපදෙස් මාලාව නිකුත් කර වසර 10කට වැඩි කාලයක් ගතවී ඇතත් වගඋත්තරකාර පාර්ශවය විසින්ම එම උපදෙස් තවමත් නිසිලෙස පිළි නොපදින තත්වයන් පවතින බවට නිරීක්ෂණය වීම.

- මේ අනුව 2020-08-21 පැවැත්වූ ලඝු නඩු විභාගයේ චෝදනාපත්‍ර අනුමත නොවිම නිසා නීති සේවා අධ්‍යක්ෂ මණ්ඩලය විසින්ම ලබා දුන් උපදෙස් අනුව මෙම පැමිණිල්ලේ අගතියට පත් පාර්ශවය වන හර්ෂ විරාජ් යන අයව නැවත 2020-10-19 දින ශ්‍රී ලංකා යුධ හමුදා පොලිස් සේවා බලකාය වෙත කැඳවා සාක්ෂි සටහන් කර ගැනිමට වගඋත්තරකරු කටයුතු කර ඇති බව නිරීක්ෂණය වන අතර එම අවස්ථාවට ඉදිරිපත් වූ අගතියටපත් පාර්ශවය හර්ෂ විරාජ් යන අය විසින් මෙහි වගඋත්තරකාර පාර්ශවය යුහ/නීති/301/නී/පොදු ( ) උපදෙස් මාලාවට අනුව කටයුතු නොකර

තමන්ගේ නිලය සැරයන් නිලයේ සිට කෝප්‍රල් නිලය දක්වා පහත හෙලා දඬුවම් විඳිමින් සිටින බැවින් ප්‍රකාශයක් ලබා දීමට අකමැත්ත ප්‍රකාශ කර අත්සන් තබා ඇති බව නිරික්ෂණය වන අතර (පිටුව 85) ඒ අනුව අගතියටපත් පාර්ශවය වන හර්ෂ විරාජ් යන අයට තමාට එරෙහිව තිබූ කාන්තා සෙබලියන් තිදෙනෙකුට වාචිකව හා ලිංගික හිංසනයක් කළ බව මූලික කරගෙන ඉදිරිපත් කළ අපකීර්ති කර හැසිරීම යන චෝදනාවට අදාළව සාක්ෂි ලබාදුන් කාන්තා සෙබලියන් තිදෙනාගෙන් හරස් ප්‍රශ්න ඇසීමට තිබූ අවස්ථාව, තමා වෙනුවෙන් සාක්ෂි දීමට හා සාක්ෂි කැඳවීමට තිබූ අවස්ථාව වැනි යුහ/නීති/301/නී/පොදු ( ) උපදෙස් මාලාවේ අන්තර්ගත බොහෝ අයිතිවාසිකම් අහිමි කරගෙන ඇති බව නිරික්ෂණය වීම.

- මෙලෙස වගඋත්තරකාර පාර්ශවය විසින් යුහ/නීති/301/නී/පොදු ( ) උපදෙස් මාලාව අනුගමනය නොකර හර්ෂ විරාජ් යන අයගේ නිල ලාංඡන සැරයන් නිලයේ සිට කෝප්‍රල් නිලය දක්වා පහත හෙලීම දඬුවම් ලබාදීමක් මෙන්ම ස්වභාවික යුක්තියේ මුලධර්ම උල්ලංඝනය කිරීමක් මෙන්ම 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3වන පරිච්ඡේදයේ 12(1) වගන්තිය මගින් ස්ථාපිත කර ඇති නීතිය පසිඳලීම හා ක්‍රියාත්මක කිරිමද නීතියේ රැකවරණයද සර්ව සාධාරණ විය යුත්තේය යන මුලික අයිතිවාසිකම උල්ලංඝනය කිරිමක් ලෙසද නිරික්ෂණය විම.

- වගඋත්කරකාර පාර්ශවය විසින් යුහ/නීති/301/නී/පොදු ( ) උපදෙස් මාලාව අනුව කටයුතු කළේ නම් හර්ෂ විරාජ් යන අයගේ නිල ලාංඡන පහත හෙලීම යන දඬුවම ඉවත් කර අදාළ පරික්ෂණ කටයුතු සිදුකළ යුතුව තිබුණත් එසේ කර නොමැති බව නිරික්ෂණය වීම.

**ඒ අනුව පහත සඳහන් නිර්දේශය ඉදිරිපත් කර සිටි.**

මෙම සියලු කරුණු පිළිබඳව අවධානය යොමු කර යුධ හමුදාවේ නීති සේවා අධ්‍යක්ෂ විසින් හර්ෂ විරාජ් යන මෙහි අගතියටපත් පාර්ශවයට පනවා තිබූ නිලය පහත හෙලීම යන දඬුවම ඉවත් කර නැවත යුහ/නීති/301/නී/පොදු ( ) උපදෙස් මාලාව අනුව නිත්‍යානුකූලව පූර්ණ විනිවිදභාවයකින් යුක්තව සාධාරණ පරීක්ෂණයක් සිදුකිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

2026-04-16 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙසට 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වගන්තිය ප්‍රකාරව වගඋත්තරකාර පාර්ශවය වෙත මෙයින් දන්වා සිටිමු.

එසේ පැමිණිලිකරු විසින්ද එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරිමට නියමිත දින සිට සතියක කාලයක් තුල මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධයෙන් කොමිෂන් සභාව වෙත දැනුම්

දිය යුතු වන අතර,එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම සම්බන්ධයෙන් සලකා නොලබන බව වැඩිදුරටත් දන්වා සිටිමු.

එල්.ටී.බී.දෙහිදෙණිය

ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)

සභාපති,

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී.පුංචිහේවා,

කොමසාරිස්,

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත් : (1) අමාත්‍යතුමා, ආරක්ෂක අමාත්‍යාංශය, ශ්‍රී ජයවර්ධනපුර කොට්ටේ. - කාරුණික දැනගැනීම සඳහා

(2) ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය, ශ්‍රී ජයවර්ධනපුර කොට්ටේ. - අවශ්‍ය පියවර ගැනීම සඳහා